සැ. යු.– 2006.07.14 දින පළ වූ අංක 1,454 දරන ගැසට් පත්‍රයේ **IV** (අ) කොටස පළ නොකරන ලදී.
පොත් නාමාවලියේ ඔක්තෝබර් - දෙසැම්බර් කාර්තුව 1999, ඉංග්‍රීසි භාෂාවෙන් මෙවර *ගැසට් පත්‍රයේ* **V** කොටසේ පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,455 - 2006 ජූලි 21 වැනි සිකුරාදා - 2006.07.21**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 880 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 880 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 883 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*– උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන ) පනත් කෙටුම්පත 2006 ජූනි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන ) පනත් කෙටුම්පත 2006 ජූනි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සුදු (විශේෂ විධිවිධාන ) පනත් කෙටුම්පත 2006 ජූනි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූලි මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජූලි මස 14 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

### පාවිච්චි කරන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් භාණ්ඩ 2006 අගෝස්තු මස 18 වැනි දින පෙ. ව. 10.00 ට රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. භාණ්ඩ වෙන්දේසියෙන් ලබා ගන්නා අය විසින් එවේලේම මුදල් ගෙවා භාණ්ඩ භූමියෙන් ඉවත්කර ගත යුතුය.

මෙම වෙන්දේසිය සම්බන්ධව අවසාන තීරණය රත්නපුර දිස්ත්‍රික් ලේකම් සතුය.

| *අංකය* | *වර්ගය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01 | 185×14 ගෙවී ගිය ටයර් | 04 |
| 02 | 215×15 ගෙවී ගිය ටයර් | 04 |
| 03 | පිල්ටර් ආසන (ලී) | 01 |
| 04 | බෙලෙක් මුදල් පෙට්ටි | 03 |
| 05. | සිවිලින් පංකා (ගලවන ලද) | 02 |
| 06. | රැස්වීම් ශාලා වානේ පුටු (අබලන්) | 11 |
| 07 | ජේම්ස් බොන්ඩ් බෑග් | 01 |
| 08 | දොර යතුරු තහඩු (අබලන්) | 12 |
| 09 | බාත්රූම් සිස්ටන් | 01 |
| 10 | මේස පංකා | 01 |
| 11 | පැරණි මේස කාර්යාල සහකාර | 01 |
| 12 | වානේ කුෂන් ඇඳිපුටු (කැඩීගිය) | 02 |
| 13 | කුෂන් පුටු අත් ඇඳි ලී | 08 |
| 14 | එකතු කිරීමේ යන්ත්‍ර කැනන් | 02 |
| 15 | සිටිසන් යන්ත්‍ර කැනන් | 02 |
| 16 | කැනන් (ඩබ්. එච්. 1200) | 01 |
| 17 | සිදුරු 02 පංචර් | 01 |
| 18 | ලිපි ද්‍රව්‍ය පෙට්ටි ලී | 01 |
| 19 | කොමඩ් සිස්ටන් | 07 |
| 20 | කොමඩ් | 05 |
| 21 | වොෂ් බේසම් පිහන් මැට් | 04 |
| 22 | ජීප් රථවලින් ගලවා ඉවත් කරන ලද කැනපිය | 02 |
| 23 | මේස ලාච්චු | 03 |
| 24 | ලැටිස් කැලි | 03 |
| 25 | අඩි 2×3 වීදුරු කැලි | 10 |
| 26 | වීදුරු සහිත ජනෙල් පියන් | 03 |
| 27 | ජනෙල් උලුවහු කැලි සහිත ලී තොගයක් (කැලි 200 පමණ) | 01 |
| 28 | ෆලයිවුඩ් දොර පියන් | 04 |
| 29 | ඇලුමිනියම් පටිකැලි තොගයක් | 01 |
| 30 | අඩි 2 ටියුබ් ලයිට් සෙට් | 04 |
| 31 | අඩි 4 ටියුබ් ලයිට් සෙට් | 02 |
| 32 | පවර් ස්ටාටැබිගාඩ් | 01 |
| 33 | පරිගණක යූ. පී. එස් | 01 |
| 34 | පුටු සාමාන්‍ය ලී | 05 |
| 35 | වාහනවලින් ගලවා ඉවත් කරන ලද අමතර කොටස් | 01 |
| 36 | හම් බෑග් | 02 |
| 37 | කුඩා ගණක යන්ත්‍ර | 01 |
| 38 | වායු සමීකරණ යන්ත්‍ර | 01 |
| 39 | ලිපිකරු මේස | 01 |
| 40 | ලාච්චු 4 ලිපිගොනු කැබිනට් වානේ | 01 |
| 41 | සාමාන්‍ය පුටු | 01 |
| 42 | පවර් එක්ස්ටෙන්ෂන් හෙඩ් | 01 |
| 43 | සී. ටී. 1200 ගණක යන්ත්‍ර | 01 |
| 44 | 125 ෆැක්ස් යන්ත්‍ර | 01 |

මාලනී එම්. ප්‍රේමරත්න,
රත්නපුර දිස්ත්‍රික් ලේකම්.

2006 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.

07-276

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙරාතුව කරනු ලබන දැන්වීම

සීදූව, රද්දොළුව පදිංචි රත්නායක මුදියන්සේලාගේ පීරිස් රත්නායක වන මම, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ (107 වන අධිකාරියේ) 07 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ජනරජයටත් සියළුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ආර්. එම්. පීරිස්.

2006 ක් වූ ජූනි මස 30 වැනි දින,
අංක 26, රද්දොළුව,
සීදූව.
07-269

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙරාතුව කරනු ලබන දැන්වීම

කෑගල්ල, පුස්සැල්ල, ගාමිණී විදුහල ඉදිරිපිට පදිංචි ජයසේකර සුබසිංහ ආරච්චිල්ලාගේ සුනේත්‍රා සුබසිංහ මැණිකේ වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරියේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

සුනේත්‍රා සුබසිංහ මැණිකේ,
ප්‍රතිඥාත ලිපිකාරිණී.

ගාමිණී විදුහල ඉදිරිපිට,
පුස්සැල්ල,
කෑගල්ල.
07-274

## ඇටෝර්නි බලපත්‍රයේ මා දුන් බලය අවලංගු කිරීම

ජපානය 949– 2233,ඕ ආසා, මියෝතෝෂි, ෆින්ඩෙන්, කමිනත මුරා, 803, නීගාතාකෙන් දරන ස්ථානයේ පදිංචිව සිට දැනට පානදුර, වේරවත්ත, මිහිඳු මාවතේ, අංක 25/38 දරන ස්ථානයේ පදිංචි උවිඩා උම්මු රහීමා (ජා. හැ. අ. 627002254 V) යන මම, දාරළුව (N.W.P.) අංක 60/174 හි පදිංචි වන්නිආරච්චිගේ දොන් මර්වින් ස්ටැන්ලි (ජා. හැ. අංක 550551098 V) යන අය මගේ ඇටෝර්නි බලකරු ලෙස පත් කරමින් ජපානයේ නිගාතකෙන්. නකාතුබිහි කුන් වකමිනේ මීයෝකොමුරු ඔසාකයා, කොගියා 949 – 22 විලාගෝ විජේ හි පදිංචි උවිඩෝ සාඩෝ ප්‍රසිද්ධ නොතාරිස් සහතික කළ 2004.04.03 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරනු ලබන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටින බව ද, එකී ඇටෝර්නි බලපත්‍රය යටතේ මින් ඉදිරියට මා වෙනුවෙන් ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මා වග නොකියන බව වැඩි දුරටත් ප්‍රකාශ කොට සිටිමි.

උවිඩා උම්මු රහීමා.

අංක 25/38, මිහිඳු මාවත,
වේරවත්ත, පානදුර.

07-279

---

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කුවෙට් රාජ්‍යයේ, සෆාට් 13099, පී. ඕ. බොක්ස් 23837 හි පදිංචි තරික් තව්ෆික් ටී. අල් -නකීබ් වන මම, කොළඹ 5, අමරසේකර මාවත, අංක 24/1, පදිංචි නිරෝෂ් මහිලාල් ද සිල්වාගේ නමින්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කන්දයියා නීලකන්ඩන් විසින් සහතික කරන ලද 2005 ජූලි මස 7 වන දිනැති අංක 1674 දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ පොදු ජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී නිරෝෂ් මහිලාල් ද සිල්වා විසින් මා උදෙසා සහ වෙනුවෙන් කරනු ලැබිය හැකි යම් දෙයක් ගැන මම වගකීම නොදරනවා ඇත.

තරික් තව්ෆික් ටී. අල් නකීබ්.

2006 ජූලි මස 05 වැනි දින දී ය.

07–319

---

## නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කිරීම පිළිබඳ දැන්වීම

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ, ගොඩගම උතුර, අංක 70ඒ ග්‍රාම නිලධාරී වසම තුළ සහ බලපිටිය මහාධිකරණය බල ප්‍රදේශය තුළ පදිංචි, ආරියරත්න රණවීර ආරච්චි වන මම, නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අංක ප්‍ර. නො. 8/25/2002/119 සහ 2006/06/16 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති හෙයින් යථෝක්ත විභාගයට පෙනී සිටීම සඳහා මාගේ අයදුම්පත ඉදිරිපත් කරන බව සියළු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

ආරියරත්න රණවීර ආරච්චි.

2006 ජූලි මස 03 වැනි දින,
අංක 96, ගොඩගම උතුර,
තෙල්වත්ත දී ය.

07–324

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පන්නිපිටිය, ඇරැව්වල, මොරගහලන්ද පාර, අංක 132/2 හි පදිංචි කන්දමුල්ල ආරච්චිගේ විජේදාස වන මා විසින් පිළියන්දල, සිද්දමුල්ල, සනත් ඇල්විටිගල මාවත, අංක 63 හි පදිංචි බලාපුවඩුගේ මනුකුලසූරිය කිංස්ලි බර්නාඩ් මෙන්ඩිස් යන අයට දී ඇති අංක 2150 සහ 1994.12.21 වැනි දින දරන ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඊ. ආර්. සී. මොරායස් විසින් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු හා බලරහිත කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයට හා ජනතාවට දන්වා සිටිමි.

කන්ද මුල්ල ආරච්චිගේ විජේදාස.

2006 ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

07-318

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

දික්වැල්ල වත්තේගම "සාමය" හි පදිංචි වසන්ති දීපානි ජයවර්ධන වන මම, මාතර දිස්ත්‍රික්කයේ මාතර මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ (107 වන අධිකාරිය) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියළු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

ඩබ්. ඩී. ජයවර්ධන.

2006 ජූලි මස 03 වැනි දින,
"සාමය", වත්තේගම,
දික්වැල්ල.

07-310

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැනුම් දීම

අගලවත්ත, යටියන, ග්‍රීන්පාර්ක් මාවතේ පදිංචි කෝරලේ කංකානම්ගේ සුසන්ත පීරිස් අබේරත්න වන මම, මෙවක් පටන් මාසයක් ගතවූ පසු කළුතර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් සුදුසුකම් ලැබීමට නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

කේ. කේ. එස්. පී. අබේරත්න.

07-302

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැනුම් දීම

අගලවත්ත, යටියන, ග්‍රීන්පාර්ක් මාවතේ පදිංචි දයා පීරිස් අබේරත්න වන මම, මෙවක් පටන් මාසයක් ගතවූ පසු කළුතර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් සුදුසුකම් ලැබීමට නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩී. පී. අබේරත්න.

07-301

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

කටුනායක, හල්ගස්තොට, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි කාරියකරනගේ ලංකේෂ් ඉන්දික පෙරේරා වන මා විසින් එස්. ඒ. ඩී. එච්. ටියුඩර් සේනාරත්න ප්‍රසිද්ධ නොතාරිස්තැන ලියා සහතික කරන ලද අංක 3413 සහ 2005.01.14 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් කටුනායක, හල්ගස්තොට, අංක 26 දරන ස්ථානයේ පදිංචි කාරියකරනගේ ලයනල් පෙරේරා යන අයට පවරා දුන් මාගේ ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මෙයින් දැනුම් දෙමි.

කේ. එල්. අයි. පෙරේරා.

2006 ජූනි මස 16 වැනි දින.

07-271

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කැළණිය, කිරිබත්ගොඩ, ජාතික නිවාස ක්‍රමයේ අංක 49/1 හි පදිංචි, පුංචි නිලමේ පුස්සැල්ල වන මම, කොළඹ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරියේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත්වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

පී. එන්. පුස්සැල්ල.

2006 ක් වූ ජූලි මස 03 වන දින,
අංක 49/1, ජාතික නිවාස ක්‍රමය,
කිරිබත්ගොඩ, කැළණිය.

07-270

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

මැණික්හින්න, නිකකැටිය "සුමුදු සෙවන" පදිංචි දිසානායක මුදියන්සේලාගේ කුලතුංග බණ්ඩාර දිසානායක වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියළු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

ඩී. ඇම්. කේ. බී. දිසානායක.

2006 ජූලි මස 03 වැනි දින,
"සුමුදු සෙවන",
නිකකැටිය,
මැණික්හින්න.

07-303

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

වතුරුගම බටේපොල, අංක 178 හි පදිංචි මල්ලව ආරච්චිගේ කුමාරදාස මල්ලවසේකර වන මම, ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළුවීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනීසිටීමට නොතාරිස් ආඥාපනතේ (107 වන අධිකාරිය) 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

එම්. ඒ. කේ. මල්ලවසේකර.

2006 ජූලි මස 21 වැනි දින,
අංක 178,
බටේපොල,
වතුරුගම.

07-309

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

දෙහිවල, නැදිමාල, පැපිලියාන පාරේ අංක 54 හි පදිංචි ලීලානන්ද නානායක්කාර වේරගොඩ හා ලතා ලක්ෂ්මී ජයවර්ධන වන අප විසින් අංගොඩ, ගොතටුව, අවිස්සාවේල්ල පාරේ අංක 12 හි පදිංචි චිත්‍රා දමයන්ති වික්‍රමසිංහ යන අයට බලය පවරා කොළඹ නීතිඥ දයා මහින්ද වික්‍රමරත්න විසින් 1996 ජනවාරි මස 29 දින සහතික කරන ලද අංක 1251 වන ඇටර්නි බලපත්‍රය 2006 ජූලි 14 වැනි දින පටන් බල රහිත වන බව ශ්‍රී ලංකාවාසී ජනතාවට සහ රජයට දන්වා සිටිමු.

ලීලානන්ද නානායක්කාර වේරගොඩ,
ලතා ලක්ෂ්මී ජයවර්ධන.

07-332

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## රුහුණු සංවර්ධන බැංකුව - තල්ගස්වල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණු සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2006.08.15 පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම් පත්තුවේ වතුරවිල පිහිටි පුස්සෙහේන හෙවත් වත්ත අද්දර කුඹුර ගොඩැල්ල නමැති අක්කර එකක් (අ. 01, රූඩ් 0, පර්. 0) විශාල ත්‍රිකෝණාකාර ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2006.01.12 දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2006.04.25 දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– උඩුගම නගරයේ සිට අකුරැස්ස පාරේ තවලම හන්දිය පසුකර තවත් මී. 500 ගිය විට හමුවන තේ කම්හල අසළින් ඇති පාරේ කි. මී. 1/2ක් ගියවිට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :

01. ගැණුම් මිලෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණු සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209.

ජී. පී. ආනන්ද,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංකය : 041-2228731.

07-305

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/68066/බී2/457.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001 ඔක්තෝබර් මස 19 දින *ගැසට් පත්‍රයේ* සහ 2002 අප්‍රේල් මස 27 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.26 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මහර තුඩුවේගෙදර, ජූඩ් පාරේ, වරිපනම් අංක 31 දරන ස්ථානයේ පිහිටි

කහටගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සැකසුණු 1990.05.06 දින හා අංක 583 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 20ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 303/62 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269.

07–384/17

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : එස්1/24448/පීඒ1/149 – 1/29183/සීඩී9/880.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002 මැයි මස 31 දින *ගැසට් පත්‍රයේ* සහ 2003 මාර්තු මස 10 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාරේ, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.31 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය සභාවේ වග උප කාර්යාලයීය සීමාවන් තුළ පිටුම්පේ සහ අරුක්වත්ත ග්‍රාමයෙහි පිහිටි ඉඩම, ඉඹුල්හේන කහටගහලන්ද, කැටකැලගහවත්ත, දෙල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. රත්නායක විසින් සැකසුණු 1983.06.13 දින හා අංක 2397 දරන පිඹුරේ කැබලි අංක 120 සහ 121 දරන්නාවූ ප්‍රමාණයෙන් පිළිවෙලින් පර්. 10ක්, හා පර්. 12ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස් සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස් අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ් 166/120, 121 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, ඉහත කී අංක 2397 දරන පිඹුරේ කැබලි අංක ආර්, එල්. සහ එච් මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ, අංක 269.

07–384/16

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ 4/1440/කේවයි1/803.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004 සැප්තැම්බර් 03 දින *ගැසට් පත්‍රයේ* සහ 2005 ජනවාරි මස 21 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී.සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ 2006 අගෝස්තු මස 26 වැනි දින පස්වරු 2.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොළ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ තැඹිලිගල පල්ලේගම පිහිටි මාරියාවත්ත වතුයායේ ඇත්ගාල කොට්ඨාසය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. බී. එම්. වේබර් විසින් සැකසුණු 1991.05.15 සිට 20 දිනැති හා අංක 1630 දරන පිඹුරේ කැබලි අංක 6 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 20ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම කොටස ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 121/284 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 1630 දරන පිඹුරේ දැක්වෙන මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ, අංක 269.

07–384/15

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/32753/සීඩී2/446.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

2002 දෙසැම්බර් මස 13 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2004 දෙසැම්බර් මස 20 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකරු එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ 2006 අගෝස්තු මස 31 වැනි දින පෙරවරු 10.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, තෙළවල ග්‍රාමයේ පිහිටි ලේඩි කැතරින් වතුයාය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු රංජිත් කරුණාරත්න විසින් සැකසුණු 1971.07.08 දින හා අංක 271 දරන පිඹුරේ කැබලි අංක 65 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 14ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එම් 1012/194 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු ආර්. කරුණාරත්න විසින් සැකසුණු 1971.11.12 දින හා අංක 271/78 දරන පිඹුර මගින්ද දක්වා ඇත. තවද එකී අංක 271 දරන පිඹුරේ කැබලි අංක 65 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරි.

2006 ජූලි මස 07 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ, අංක 269.

07–384/14

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/25859/සීබී7/869.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005 සැප්තැම්බර් මස 02 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2005 ඔක්තෝබර් මස 31 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකරු එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ 2006 අගෝස්තු මස 24 වැනි දින පස්වරු 1.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.



### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ඉහළ හංවැල්ල පිහිටි මහයාය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ජී. සී. ඩයස් විසින් සැකසුණු 1962.12.05, 07 දිනයන් සහ අංක 407 දරන පිඹුරේ කැබලි අංක 10 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 35ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන් 39/230, එන් 61/222 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, ඉහත කී පිඹුරේ කැබලි අංක 14 මතින් දැක්වෙන මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරි.

2006 ජූලි මස 07 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ, අංක 269.

07–384/13

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 5/67277/ඩී5/675.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001 ජූනි මස 15 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2001 සැප්තැම්බර් මස 15 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, මීගමුව, ප්‍රනාන්දු මාවතේ, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී.සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ 2006 අගෝස්තු මස 26 වැනි දින පස්වරු 4.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලෙපොල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පල්ලේපොල ග්‍රාමයෙහි පිහිටි පල්ලෙවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඕ. පෙරේරා විසින් සැකසුණු 1992.08.14 දින හා අංක 60 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් රූ.1,පර්.34 ක් වූ බෙදා වෙන්

කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 385/107 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
ගාලු පාරේ අංක 269.
කොළඹ 03.

07–384/12

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ල බන විකිණීමෙ පිළිබඳ දැන්වීමයි

ණය අංකය : 1/35677/සීඩී4/673.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා අයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.02.17 *ගැසට් පත්‍රයේ* සහ 2006.03.13 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාරේ, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.24 වෙනි දින පස්වරු. 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දිද්දෙණිය ග්‍රාමයේ පිහිටි වර්ඩින් වතුයායේ කේලාන්පිටිය කොටස, තනන්පිටිහේන ලෙසද, හැඳින්වෙන ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සැකසුණු 1998.02.27 දින සහ අංක 2257 දරන පිඹුරේ කැබලි අංක 5 ඒ 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූ.0, පර්. 15 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟවේ. මෙම ඉඩම් කොටස අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 102/236 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී මිනුම් පිඹුරේ කැබලි අංක 5 ඒ 12 (මීටර් 6 ක් පළල) සහ 5 ඒ 23 (අඩි 14 ක් පළල) මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

07-384/11

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ල බන විකිණීමේ පිළිබඳ දැන්වීමයි

ණය අංකය : 1/41525/සීඩී6/411.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා අයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.04.17 *ගැසට් පත්‍රයේ* සහ 2004.06.18 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාරේ, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්.. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.24 වෙනි දින මධ්‍යාහ්න12.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පෝරේගෙදර පිහිටි දේවාලේළහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. සිරිල් විසින් සැකසුණු 1999.01.24 දින හා අංක 3687 දරන පිඹුරේ කැබලි අංක ඒ 1 ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ.1, පර්. 10 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන් 204/157 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 3687 දරන පිඹුරේ කැබලි අංක ඒ 1 සී මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

07-384/10

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංකය : 6/34293/පී6/150.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා අයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.12.09 *ගැසට් පත්‍රයේ* සහ 2006.02.20 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාරේ, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.31 වෙනි දින පස්වරු. 4.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ උතුර, කළුතර බැද්ද පලාතොට පිහිටි ගොඩපොරගහවත්ත එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. කොඩිකාරගේ විසින් සැකසුණු 1998.01.19 වඩාත් නිවැරදිව 1998.01.20 දින හා අංක 2503 දරන පිඹුරේ කැබලි අංක 13 බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්.0, රූ.0, පර්. 30.83 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඡී 161/191 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 2503 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජූලි මස 07 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

07-384/9

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංකය : 1/36916/සීඩී4/969-1/41007/සීඩී5/760.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා අයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.02.13 *ගැසට් පත්‍රයේ* සහ 2004.09.03 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාරේ, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.31 වෙනි දින පස්වරු. 12.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ අරුක්වත්ත ග්‍රාමයේ පිහිටි මිල්ලෑව ගෘප් හි අරුක්වත්ත කොට්ඨාසයේ කොටසක් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඩී. ඒ. වීරසිංහ විසින් සැකසුණු 1997.10.27 දින හා අංක 1323 දරන පිඹුරේ කැබලි අංක 48 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්.0, රූ.0, පර්. 16.13 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන් 181/270 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 1323 දරන පිඹුරේ කැබලි අංක 83, 93, 95 මතින් වැටී ඇති මාර්ග අයිතිය ද සමඟ වේ

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජූලි මස 07 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

07-384/8

---

## මහජන බැංකුව - කොබෙයිගනේ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 ඩී දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, බලදොර කෝරළේ, කොබෙයිගනේ ගමෙහි පිහිටි "වානෝහේන" (දැනට වත්ත) නමැති ඉඩමට සාදන ලද අංක 5509 සහ 2002.09.22 දිනැති පිඹුරේ ලොට් 01 දරන විශාලත්වය පර්චස් තුනයි දශම නවය (අ. 0, රූඩ් 0, පර්. 3.9) ක් විශාල වූ ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සැම සියලු දේ ද සමග මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාවෙත පවරන ලද බලය යටතේ මා විසින් 2006.08.11 දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2005.04.15 දින දී ද දිනමිණ පුවත්පතේ 2005.07.14 දිනදී ද, ඩේලිනිවුස් පුවත්පතේ 2005.07.14 දින දී ද, තිනකරන් පුවත්පතේ 2005.07.14 දිනදී ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* : කොබෙයිගනේ බස් නැවතුම්පල ඉදිරිපිට දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, කුරුණෑගල ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකතන අංකය : 037-2222453.
ෆැක්ස් අංකය : 037-2222338.

හිමිකම් හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. එම්. අයි. ගල්ලැල්ල (සාම විනිසුරු),
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු,

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත, කුරුණෑගල.

දුරකතන : 037-2220062.

07- 328

---

## මහජන බැංකුව - මැණික්හින්න ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාත, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ කෝරළේ කුරගන්දෙණිය පිහිටි " බිලින්වගහමුල වත්ත " නමැති ඉඩමට, මැනුම්පති විසින් මැන සාදන ලද අංක PPA/3106 පිඹුරේ කට්ටි අංක 12 දරන පර්චස් තිස් අටයි දශම බිංදුවයි හතක් (අක්. 0, රූ. 0, පර්චස්. 38.07)ක් විශාල ඉඩම සහ මහල් නිවස මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය මත අප විසින් 2006.08.24 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ* 2003.11.07 වැනි දින ද, දිණමිණ, ඩේලිනිව්ස්, සහ තිනකරන්, යන පුවත්පත්වල 2004.12.15 වැනි දින ද, පළකර ඇති දේපළ වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– මැණික්හින්න ග්‍රාමීය බැංකුව අසලින් පොලීසිය පාරේ දකුණු පසින් ඉහත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල. ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතුය.

දුරකතන අංකය : 081-2234283.
ෆැක්ස් අංකය : 081-2223017.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බලයලත් වෙන්දේසිකරුවෝ
(රාජ්‍ය හා පෞද්ගලික බැංකුකරුවන් වෙනුවෙන්
සහ උසාවි කොමසාරිස්වරු).

| | |
|---|---|
| *ප්‍රධාන කාර්යාලය* : | *නාගරික කාර්යාලය* : |
| අංක 24, ටොරින්ටන් පාර, | අංක 55 ඒ, ධර්මපාල මාවත, |
| මහනුවර. | කොළඹ 03. |
| දුරකතන අංක : | දුරකතන අංක : |
| 081-2224371. | 011-2448526, 011-2441761, |
| 081-2227593. | 011-2448526. |
| ෆැක්ස් අංකය : 081-2224371. | ඊමේල් : samera@sri.lankanet. |

07- 327

---

## සීමාසහිත සෙලාන් බැංකුව – සරික්කාමුල්ල ශාඛාව

### 1990 අංක 4 දන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගිණුම් අංකය : 400-03530574-001.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර සල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභාවේ කෙසෙල්වත්ත උප ඒකක සීමාව තුළ

තොටවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු පී. මල්වැන්න විසින් සාදන ලද 1997.10.25 දිනැති අංක 1016 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කජුගහවත්ත *හෙවත්*කජුගහ ඕවිට නැමැති ඉඩමේ එහි පිහිටි ගොඩනැගිල්ල සමග මුවර්ස් පාර වරිපනම් අංක 25/12 දරන කැබලි අංක 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම දෙකයි එකක් (අ. 0 රූ. 0 පර්. 8.21)ක් විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 329/134 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපළ පානදුර පදිංචි අමීර් ලෙබ්බේ මොහොමඩ් කමිල් යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2006 අගෝස්තු මස 08 වැනි දින පෙරවරු 11.00ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2006.04.21 දින ද, ලංකාදීප සහ ඩේලිමිරර් පත්‍රයේ 2006.05.10 දින ද, වීරකේසරි පත්‍රයේ 2006.04.24 දින ද පළ වී ඇත.

*ඉඩමට පිවිසීම.*– ගාලු පාරේ කෙසෙල්වත්ත හංදියේ සිට මීටර් 400 ක් ගිය විට ඇති පල්ලිමුල්ල හංදියෙන් වමට ඇති ශ්‍රී සංඝරත්න මාවතේ මීටර් 750 ක් ගිය විට හමුවන වට්ටල්පොල හංදියෙන් වමට ඇති වීරවන්න පාරේ මීටර් 600 ක් ගිය විට හමුවන මුවර්ස් පාරේ මීටර් 400 ක් ගිය විට දේපළට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. (1) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) (2) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරී බද්ද (සියයට එකක්) (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 (5) ලිපිකරු සහ සෝෂක වේතන රු. 500 (6) සියළුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද, විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) සීමාසහිත සෙලාන් බැංකුව අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 11-2456258, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස් තක්සේරුකරු.

ටී. ඇන්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක 011-2696155, 011-2572940.

07-383

## සීමාසහිත සෙලාන් බැංකුව – ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ණයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 08 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ බලයලත් මිනින්දෝරු එම්. බාලක්‍රිෂ්ණන් විසින් පිළියෙල කළ 1990 පෙබරවාරි 16 දාතම අංක 431 දරන බහු පාර්ශ්වීය (කොන්ඩෝමිනියම්) පිඹුරේ විස්තර කර ඇති පංචිකාවත්ත පාරේ වරිපනම් අංක 228 දරන බිම් මහලේ ඒකක 2 යනුවෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කර ඇති මායිම්, නියම වූ ඉතා අගනා ව්‍යාපාරික පරිශ්‍රය බිම් ප්‍රමාණයෙන් වර්ග අඩි 1,623.87 කින් සමන්විතයි.

ආසන්නතම පොදු ප්‍රවේශ ප්‍රදේශය වශයෙන් ඒයූ 2 ප්‍රවේශය සහිත, එකී 2 වන ඒකකය උතුරට : මම ඒකකය (පංචිකාවත්ත පාරේ) වරිපනම් අංක 234 හා 234 ඒ දරන පරිශ්‍රයන් ගෙන් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද, සහ ඒයූ 2 (පඩිපෙළ) ද, නැගෙනහිරට : මෙම ඒකකය සීඊ 2 (ගෙවතු ඉඩකඩ) වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද, දකුණට : මෙම ඒකකය සීඊ 1 ගෙවතු ඉඩකඩින් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යය ද හා මෙම ඒකකය 1 වන ඒකකයෙන් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද, බටහිරට : පංචිකාවත්ත පාරේ පදික වේදිකාවෙන් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද ඉහළ මුදුනට මෙම ඒකකයට ඉහළින් පිහිටි 3 වන ඒකකයේ ගෙබිමේ මධ්‍යයද, සහ පහළ යටතට මෙම ඒකකයේ බිම් මහලද මායිම් වන, කොළඹ ඉඩම් කාර්යාලයේ ඒ 32/37 යටතේ ලියාපදිංචි කොට ඇති එකී සහාධිපත්‍ය පිඹුරේ සඳහන් ආකාරයට පොදු මූලාංගයන්ගෙන් 18.38% අනුපාතික ප්‍රමාණයක කොටස් හිමි ඒකකය.

පොදු මූල ද්‍රව්‍ය:-

(අ) ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම,
(ආ) පිටු අංක 3 බිම් මහලේ දක්වා ඇති පරිදි සීඊ 1 (කහ මායිම), සීඊ 2 (නිල් මායිම) සහ සීඊ 3 (කොළ මායිම) යනුවෙන් ලකුණුකර ඇති ඉතිරි කොටස (සීඊ යනු උද්‍යාන කොටසයි),
(ඇ) ගොඩනැගිල්ලේ අත්තිවාරම් කුළුණු මහ බාල්ක, බාල්ක, මුක්කු, ප්‍රධාන බිත්ති හා වහලය,
(ඈ) පොළොවෙහි මළ පහවන සේවාවන්,
(ඉ) ඉඩම තුළ මතුපිට කාණු,
(ඊ) ගොඩනැගිල්ලේ නඩත්තුව හා ආරක්ෂාව සඳහා සපයා ඇති වෙනත් පහසුකම්
(උ) 1. ඒයූ 1-පිළිවෙළින් පළවෙනි සහ දෙවැනි මහල් හි ඒකක 3 හා ඒකක 4 හි සෝපාන ශාලාව
2. ඒයූ 2, බිම් මහලේ ඒකක 2 ට ඇති සෝපාන ශාලාව (ඒයූ) 1 සහ ඒයූ 2, බිම් මහල් සැලැස්මේ පළමු මහල් සැලැස්මේ හා දෙවන මහලේ සැලැස්මේ පිටු අංක 3, 4 සහ 5 හි දක්වා ඇති අතිරේක ඒකක සඳහා වෙන් කර ඇත).
(ඌ) 1, සීඊ 1 සිට බිම් මහලේ ඒකක 1 දක්වා,
2. සීඊ 2 සිට බිම් මහලේ ඒකක 2 ට පළමු මහලේ ඒකක 3 ට හා දෙවන මහලේ ඒකක 4 ට (සීඊ) සීඊ 2 සහ සීඊ 3 (බිම් මහලේ සැලැස්මේ පිටු අංක 3 බිම් මහලේ සීඊ 3 ප්‍රවේශ ඒකකය සිට ඒකක 1 සහ 2 දක්වා,

3 හි පොදු කොටස් සඳහා වෙන් කර ඇත).

සහාධිපත්‍ය (කොන්ඩෝමිනියම්) දේපළ හා කොන්ඩෝමිනියම් (සහාධිපත්‍ය) දේපළ ගොඩනැගිල්ලට සාදන ලද අංක 431) දරන සහාධිපත්‍ය (කොන්ඩෝමිනියම්) සැලැස්මේ පිටු අංක 3, 4 සහ 5 හි බිම් මහල් සැලැස්මේ,

පළමු මහල් සැලැස්මේ, 2 වන මහල් සැලැස්මේ දක්වා ඇති අතිරේක ඒකක ඒ යූ 2 බිම් ප්‍රමාණයෙන් වර්ග අඩි 200 වන එම් ඒ යූ 2 ඒකකය (බිම් මහල, පළමු මහල සහ දෙවන මහල (සෝපාන ශාලාව) ට මායිම්, උතුරට : ඡේකාවත්ත පාරේ) වරිපනම් අංක 234 සහ 234 ඒ පරිශ්‍රයන්ගෙන් මෙම ඒකකය වෙන් කරනු ලබන බිත්තියේ මධ්‍යය නැගෙනහිරට : මෙම ඒකකය 2, 3 සහ 4 වන ඒකක වලින් වෙන් කරන බිත්තියේ මධ්‍යය සීර් 2 ඉහලියන් අවකාශය (උද්‍යාන අවකාශය) දකුණට : මෙම ඒකකය 2, 3 සහ 4 වැනි ඒකක වලින් වෙන් කරන බිත්තියේ මධ්‍යය, බටහිරට : මෙම ඒකකය 2, 3, සහ 4 වැනි ඒකක වලින් වෙන් කරන බිත්තියේ මධ්‍යය සිතිජය (උඩ අහස් මුදුන) මෙම ඒකකයේ වහළ අධස්වසිතාක්‍ය (යට අහස් මුදුන) මෙම ඒකකයේ බිම් මහල, මෙකී මායිම් අංක 431 දරන සැලැස්ම අනුව වේ.

තවද, ඉතා වටිනා වාණිජ ඉඩම් කොටසක්.–

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සහා සීමාව තුළ අළුත්කඩේ නැගෙනහිර (කලින් ස්කිනර්ස් පාර දකුණ යනුවෙන් හඳුන්වන ලද ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි ශ්‍රී සංඝරාජ මාවතේ වරිපනම් අංක 215/1 දරන බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද අංක 2967 හා 2964 1964 අගෝස්තු මස 22 වැනි දාතම දරන සැලැස්මේ ලොට් අංක 8 වශයෙන් දක්වා ඇති (ඉඩම් ප්‍රමාණයෙන් පර්චස් 3.25 ක් වූ ඉතා අගනා වාණිජ ඉඩම් කොටස (කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 228 හි බන්දුල ට්‍රේඩින් එන්ටර්ප්‍රයිසස් යන ව්‍යවහාර ව්‍යාපාරික නාමය යටතේ නාමය, විලාශය, හා අභිධානය යටතේ තනි අයිතිකරු වශයෙන්) ව්‍යාපාර පවත්වාගෙන යන ගල්හේනගේ අජිත් බන්දුලසේන යන අයට අයත් දේපළ අංක 1342 හා 1993.09.09 දාතම දරන අංක 1492 හා 1993.11.05 දාතම දරන අංක 3346 හා 1995.06.21 දාතම දරන අංක 1203 හා 1993.07.21 දාතම දරන අංක 3255 හා 1995.05.03 සහ 698 හා 17/11/95 දාතම දරන බැඳුම්කර යටතේ බන්ධනදායී/ උකස්කරු වශයෙන් ගෙවිය යුතු ගෙවීම් පැහැර හැර ඇත.)

සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරන ලද බලතල ප්‍රකාර ඉහත සඳහන් දේපළ 2006 අගෝස්තු 08 වැනි අඟහරුවාදා පෙ. ව. 10.30 ට ආරම්භව පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2000.07.21 වැනි දින රජයේ *ගැසට් පත්‍රය ද*, 2000.07.12 දින ඩේලිනිව්ස්, දිනමිණ පුවත්පත් ද 2000.07.26 දින තිනකරන් පුවත්පත් ද විකුණුම් නිවේදනය සඳහා 2006.07.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

*ගෙවන පිළිවෙල :*

1. මිල තීන්දු වනවාත් සමගම ගැණුම් මිලෙන් 10%ක්,
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට රාජකාරි දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක්) දේශීය විකුණුම් බද්ද,
4. විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාරක්) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
5. රු. 44,645 නොඉක්මන සම්පූර්ණ ප්‍රචාරක වියදමෙන් 50% ක්,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 4,000.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපිලේඛන කොළඹ 03, ගාලු පාරේ, අංක 90 හි සෙලින්කෝ සෙලාන් ටවර්හි (Ceylinco Seylan Tower) හි 12 මහලේ සීමාසහිත සෙලාන් බැංකුවේ සහකාර සමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් පරීක්ෂා කර බැලීමටත් පුළුවන.

දුරකතන අංක : 074-701256/7, 074-701291, 2456258.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්,
විශේෂඥ වෙන්දේසිකරු, තක්සේරුකරු,
සහ දේපළ නියෝජිත.

අංක 381/1, ගාළුපාර,
කොළඹ 04.

දුරකතන අංක : 2591167,
දුරකතන/ෆැක්ස් අංක : 2584874, 2500838,
ක්ෂණික ඇමතුම් : 0772250422.

07-385

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.